(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 10(3).]

# පාර්ලිමේන්තුවේ අංක 10 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2014 පෙබරවාරි මස 21 වැනි සිකුරාදා**

## 2014 මාර්තු මස 04 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සහ 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 ජනවාරි 21 දිනැති අංක 1846/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.02.19 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 21, 22, 23, 24 සහ 24 අ වගන්ති සමග කියවිය යුතු, එම පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ඔක්තෝබර් 24 දිනැති අංක 1833/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.02.19 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 1),— සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ජනවාරි 30 දිනැති අංක 1847/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.02.18 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 2),— සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ජනවාරි 30 දිනැති අංක 1847/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.02.18 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 3),— සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ජනවාරි 30 දිනැති අංක 1847/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.02.18 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

## 2014 මාර්තු මස 07 වැනි සිකුරාදා

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා.199/'13

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— අපනයන වෙළඳපොළ සඳහා දූරියන් වගා කිරීම,— මෙරටට සැලකිය යුතු විදේශ විනිමය ආදායමක් ඉපැයිය හැකි වන පරිද්දෙන්, මිල අධික නමුදු අපනයන වෙළඳපොළෙහි ඉහළ ඉල්ලුමක් සහිත ජනප්‍රිය පලතුරු වර්ගයක් වන දූරියන් වාණිජ මට්ටමෙන් වගා කරනු පිණිස පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.200/'13

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ත්‍රි භාෂා ශ්‍රී ලංකාවක් සඳහා වූ දස අවුරුදු සැලැස්ම,— "ත්‍රි භාෂා ශ්‍රී ලංකාවක් සඳහා වූ 2012-2021 දස අවුරුදු සැලැස්ම" යන මැයෙන් වූ දස අවුරුදු සැලසුමට හිමිවූ අමාත්‍ය මණ්ඩල අනුමතියට ප්‍රසංශාව පළ කරන අතර, මෙම ව්‍යාපෘතිය සීඝ්‍රයෙන් හා දීප ව්‍යාප්තව බහු භාෂාවන් කථා කරන බහු වාර්ගික ජනතාවගේ පූර්ණ සහය ලබාගෙන, රාජ්‍ය සහ පුද්ගලික ආයතනවල සහයෝගයෙන් මුළු රටටම ප්‍රයෝජනවත් වන ආකාරයෙන් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

## 2014 මාර්තු මස 20 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2904/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මේ වනවිට ජංගම සහ CDMA දුරකථන සබඳතා සැපයීම සඳහා බලපත්‍ර ලබා දී ඇති සමාගම්වල නම් කවරේද;

(ii) ඉහත සමාගම්වල අධ්‍යක්‍ෂවරුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2006 වර්ෂයෙන් පසුව ජංගම සහ CDMA දුරකථන පහසුකම් සපයන සමාගම්වලට නිකුත් කරන ලද නව සංඛ්‍යාතයන් සහ දුරකථන මාර්ග කවරේද;

(iv) එම සමාගම්වල අධ්‍යක්‍ෂවරුන්ගේ නම් කවරේද;

(v) සංඛ්‍යාතයන් සහ දුරකථන මාර්ග වෙන් කිරීමේදී ලබාගත් විශේෂඥ උපදෙස් කවරේද;

(vi) 2011 සහ 2012 වර්ෂ සඳහා ඉහත සමාගම් මගින් රජයට ගෙවන ලද මුදල් ප්‍රමාණයන් සමාගම් අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වෙළඳපොළ මිලට වඩා සැලකිය යුතු තරම් අඩු මුදලකට ජංගම දුරකථන පහසුකම් සපයන සමාගම්වලට බලපත්‍ර ලබා දී තිබේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3212/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රංගිරි දඹුලු රජමහා විහාර සංඝ සභාවේ සාමාජිකත්වය දරන භික්ෂුණීන්වහන්සේලාගේ ජාතික හැඳුනුම්පත්වල 2004 වර්ෂය දක්වා භික්ෂුණීන්වහන්සේ යනුවෙන් සඳහන් කර තිබූ බවත්;

(ii) 2004 වර්ෂයට පසුව බෞද්ධ කටයුතු කොමසාරිස් විසින් එලෙස හැඳුනුම්පත් නිකුත් නොකරන ලෙස දන්වා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් භික්ෂුණීන්වහන්සේලා ද මෙරට පුරවැසියන් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, උන්වහන්සේලා සඳහා 'භික්ෂුණීන්වහන්සේ' යනුවෙන් සඳහන් කර ජාතික හැඳුනුම්පත් නිකුත් නොකිරීමට හේතු කවරේද;

(iii) භික්ෂුණීන්වහන්සේලාගේ ගෞරවය රැකෙන ලෙස 'භික්ෂුණීන්වහන්සේ' යනුවෙන් සඳහන් කර ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3384/'12

ගරු පී. හැරිසන් මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 1950 වර්ෂයෙන් පසු මෙරට සිදු කළ අලි සංගණන සංඛ්‍යාව, ඒවා පැවැත්වූ වර්ෂයන් සහ එම එක් එක් සංගණනය පිළිබඳ තොරතුරු කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 වර්ෂයේ සිදු කළ අලි සංගණනයට වැය කළ මුදල කොපමණද;

(ii) එහි වාර්තාව ඉදිරිපත් කරන්නේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) එකී වාර්තාවට අනුව වැඩි වී ඇති අලි ගහනයට සාපේක්ෂව ඔවුන් රැකබලා ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) විදේශීය සංචාරකයින් සඳහා වන අලි හා වන සතුන් නැරඹීමේ ස්ථාන සකස් කර තිබේද;

(ii) එම ස්ථාන කවරේද;

(iii) එක් සංචාරකයෙකුගෙන් එම ස්ථානවල දී අයකරනු ලබන මුදල කොපමණද;

(iv) පසුගිය වර්ෂ පහ තුළ එවැනි ස්ථානවලින් උපයාගෙන රජයට ලබා දී ඇති ආදායම වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් වනජීවි සංරක්ෂණ ප්‍රවර්ධනයට ලබා දෙන දායකත්වය සම්බන්ධ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(ii) වනාන්තර භූමි අඩුවීම නිසා, තම පැවැත්ම සම්බන්ධයෙන් අනතුරට ලක් වී ඇති වනසතුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

4051/'13

ගරු අජිත් කුමාර මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර, පානදුර පාරේ ඇල්ලගාව සිට දුම්බර මානාන, කැටේපොල ප්‍රදේශවලට යන මාර්ගයේ කළුගඟ හරහා ඉදිකොට ඇති තාවකාලික පාලම අබලන්වී ඇති බව දන්නේද;

(ii) අබලන්වී පවතින එම පාලම මතින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ හා වෙනත් බර වාහනවලට ගමන් කිරීමට ඉඩහැර තිබීමට හේතුව කවරේද;

(iii) එම අබලන් පාලම භාවිතා කිරීමේදී සිදුවිය හැකි අනතුරක වගකීම භාර ගන්නේ කවුරුන්ද;

(iv) එම පාලම අබලන් බවටත්, වාහන ගමනාගමනය අනතුරුදායක බවටත් දැනුවත් කර දැන්වීම් පුවරු සවිකර තිබීම ප්‍රමාණවත් නොවන බව දන්නේද;

(v) එසේ නම්, එම තාවකාලික පාලම වෙනුවට ස්ථිර පාලමක් ඉදිකරන්නේද;

(vi) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4097/'13

ගරු අනුර දිසානායක මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ත්‍රිකුණාමලය නගර සභාව ඇමෙරිකා එක්සත් ජනපදය සමග ගිවිසුමක් අත්සන් කර තිබේද;

(ii) එසේ නම්, එම ගිවිසුමේ අරමුණු කවරේද;

(iii) එවැනි ගිවිසුමක් අත්සන් කිරීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් අවසර ගෙන තිබේද;

(iv) නගර සභාවකට යම් විදේශීය රාජ්‍යයක් සමග ගිවිසුම් අත්සන් කිරීමට බලය තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4138/'13

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අක්කරපත්තුව හා කොළඹ අතර බස් සේවාව මේ වන විට අත්හිටුවා ඇති බවත්;

(ii) එම තත්ත්වය යටතේ අක්කරපත්තුවේ සිට ඉරාකාමම් හා හිඟුරාන හරහා කොළඹ දක්වා ගමන් කරන මගීන්ට මහත් දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් තත්ත්වය සලකා බලා අක්කරපත්තුව හා කොළඹ අතර සෘජු බස් සේවයක් කඩිනමින් ඇරඹීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4158/'13

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් විසන්ධි කරන ලද ජල සම්බන්ධතා නැවත ලබා දීමේදී ගෘහස්ත ජල පාරිභෝගිකයෙකුගෙන් රු. 500.00ක් හා ව්‍යාපාරික ස්ථානයකින් රු.1500.00ක් බැගින් අයකළ බවත්;

(ii) විසන්ධි කරන ලද ජල සම්බන්ධතාවක් නැවත ලබා දීමේ ගාස්තුව මේ වන විට ගෘහස්ත ජල පාරිභෝගිකයෙකු වෙනුවෙන් රු.2300.00ක් හා ව්‍යාපාරික ස්ථානයක් වෙනුවෙන් රු. 6900.00ක් දක්වා ඉහළ දමා ඇති බවත්;

(iii) විසන්ධි කරන ලද ජල සම්බන්ධතා නැවත ලබා දීමේ නව ගාස්තු පෙර පැවති ගාස්තුව මෙන් පස් ගුණයකින් ඉහළ යාම නිසා සමස්ත ජල පාරිභෝගිකයින් තදබල පීඩනයකට ලක්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) විසන්ධි කරන ලද ජල සම්බන්ධතා නැවත ලබා දීමේ දී දැනට අයකරන ගාස්තු මුදල සංශෝධනය කොට, සමස්ත ජල පාරිභෝගිකයන් හට සහනයක් සලසා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4180/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයේ 'සම්ප්‍රේෂණ බෙදා හැරීමේ අරමුණු' නමැති ව්‍යාපෘතියට අදාළව කොළඹ 'පයිජ්' පාරේ ඇති ව්‍යාපෘති කාර්යාලය ලබා ගැනීමේදී අනුගමනය කළ ටෙන්ඩර් පටිපාටිය කවරේද;

(ii) ලංකා විදුලිබල මණ්ඩලයට කුලී පදනම මත වාහන ලබා ගැනීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විවිධ යන්ත්‍රසූත්‍ර මිලදී ගැනීමේදී එහි තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා නිලධාරීන් විදේශගතවීමේ ක්‍රියාපටිපාටිය සිදුවන ආකාරය කවරේද;

(ii) 2011 සිට 2013 ජුනි මාසය වන තෙක් එසේ විදේශගත වූ නිලධාරීන්ගේ තොරතුරු කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ලංකා විදුලිබල මණ්ඩලය මගින් විවිධ ධාරිතාවයෙන් යුතු 'ට්‍රාන්ස්ෆෝමර්' වර්ග මිලදී ගනු ලබන ආයතන කවරේද;

(ii) 2011 සිට 2013 ජුනි දක්වා කාල සීමාවේදී එම එක් එක් ට්‍රාන්ස්ෆෝමර් වර්ගය මිලදී ගැනීමේදී අනුගමනය කළ ටෙන්ඩර් පටිපාටිය පැහැදිලි කරන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4221/'13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011, 2012 සහ 2013 වර්ෂවලදී පාරිභෝගික සුබසාධනය උදෙසා ගන්නා ලද පියවර කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4227/'13

ගරු රන්ජන් රාමනායක මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004 වර්ෂයේ සිට මේ දක්වා මහජන ඡන්දයෙන් තේරී පත්වූ ප්‍රාදේශීය සභා නියෝජිතයින්, නගර සභා නියෝජිතයින් සහ පළාත් සභා නියෝජිතයින් අතරින් මේ වනවිට දූෂණ, අපරාධ හෝ වෙනත් නීති විරෝධී ක්‍රියා සිදුකිරීම හේතුවෙන් චෝදනා එල්ලවී ඇති සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, අයත් දේශපාලන පක්ෂ සහ ඔවුන් පළාත් සභාවේ, නගර සභාවේ හෝ ප්‍රාදේශීය සභාවේ දැරූ හෝ දැනට දරන තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් මහජන නියෝජිතයින් අතරින් මේ වන විට නීති මගින් කටයුතු කිරීම ආරම්භකර ඇති සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වන විට නීතිය ඉදිරියට පමුණුවා වරදකරුවන් වී දඬුවම් ලැබූවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත පරිදි දූෂිත පිරිස් පළාත් සභා සහ පළාත් පාලන ආයතන නියෝජනය කිරීම සංවිධානාත්මක දූෂණ, අපරාධ හා නොයෙකුත් නීති විරෝධී ක්‍රියාකාරකම් තවදුරටත් සිදුවීමට හේතු වී ඇති බව පිළිගන්නේද;

(ii) නීති විරෝධී ක්‍රියාවන්හි යෙදෙන දූෂිතයන් හා අපරාධකරුවන් ප්‍රාදේශීය හා පළාත් සභා දේශපාලනයට පිවිසීම වැළැක්වීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4280/'13

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 නොවැම්බර් 19 වැනි දින සිට 2013 ජූනි මස 30 වැනි දින දක්වා කාලය තුළ අමාත්‍යවරුන්ට (කැබිනට් සහ කැබිනට් නොවන), නියෝජ්‍ය අමාත්‍යවරුන්ට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) එම චෝදනා එල්ල වී ඇති අමාත්‍යවරුන්ගේ, නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් කවරේද;

(iii) එම එක් එක් අමාත්‍යවරයාට, නියෝජ්‍ය අමාත්‍යවරයාට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට එරෙහිව ඇති චෝදනා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත පැමිණිලි සම්බන්ධයෙන් එකී කොමිෂන් සභාව මගින් විමර්ශන අවසන් කර ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) විමර්ශන අවසන් කොට ඇති පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති ඉදිරි පියවර වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ දක්වා විමර්ශන අවසන් කර නොමැති පැමිණිලි සම්බන්ධව කඩිනම්ව සහ විධිමත්ව විමර්ශන කටයුතු සිදු කරන්නේද;

(iv) ඒ සඳහා ගතවේ යැයි අපේක්ෂා කරන කාල සීමාව කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4285/'13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අද වන විට ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන දියර කිරි ලීටර සංඛ්‍යාව කොපමණද;

(ii) මහින්ද චින්තන වැඩසටහන යටතේ, 2016 වර්ෂය වන විට ළඟාකර ගැනීමට අපේක්ෂිත දේශීය දියර කිරි නිෂ්පාදනය කිරි ලීටර් කොපමණද;

(iii) 2016 වර්ෂය වන විට කිරි පරිභෝජන අවශ්‍යතාව කොපමණදැයි ගණන් බලා තිබේද;

(iv) එසේ නම්, එම ප්‍රමාණය කොපමණද;

(v) මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා රජය ක්‍රියාත්මක කර ඇති හා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2013 වර්ෂයේ ජනවාරි සිට මේ දක්වා ආනයනය කර ඇති දියර කිරි, කිරි පිටි, බටර් සහ චීස් වැනි කිරි නිෂ්පාදනවල ප්‍රමාණය, වටිනාකම සහ ඒවා ආනයනය කරන ලද රටවල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මෙම ආනයන වියදම අවම කර ගැනීම සඳහා රජය ගෙන ඇති පියවර කවරේද;

(iii) කිරි නිෂ්පාදනය, දේශීය කිරි පිටි නිෂ්පාදනය සහ අනෙකුත් කිරි නිෂ්පාදන සම්බන්ධයෙන් පෞද්ගලික අංශය / බහු ජාතික සමාගම් දක්වන දායකත්වය ප්‍රමාණාත්මකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4313/'13

ගරු තිස්ස අත්තනායක මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උඩවලව, යාල, විල්පත්තුව, වස්ගමුව, ගල්ගමුව හා අනුරාධපුර ආදී ප්‍රදේශවල ජීවත් වන ජනතාව තවමත් වන අලින්ගේ ප්‍රහාරවලට ලක්වන බවත්;

(ii) වන අලින්ගෙන් සිදුවන උවදුරුවලින් එම ප්‍රදේශවල ජනතාව බේරා ගැනීමේ පිළියමක් ලෙස 2002 වර්ෂයේ සිට විදුලි වැටවල් නඩත්තු කිරීම, වල් අලි පලවා හැරීම, දඩයම්කරුවන් හා දඩමස් අලෙවි කරන්නන් නීතිය හමුවට ගෙන ඒම ආදී කටයුතු සඳහා වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය සඳහා අනියම් කම්කරුවන් ලෙස පුද්ගලයින් බඳවා ගත් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(ii) හි පරිදි බඳවා ගෙන ඇති සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) 2013.01.01 දින සිට එම සේවකයින්ගේ සේවය අත්හිටුවා ඇති බැවින් එම ප්‍රදේශවල වන අලින්ගෙන් සිදුවන අනතුරු නැවත වර්ධනය වී ඇති බවත්, රැකියා අහිමි වූ එම පිරිස දැඩි අපහසුතාවයකට පත්වී ඇති බවත් පිළිගන්නේද;

(iii) එසේ නම්, එම සේවකයින්ට නැවත සේවය ලබාදී, ස්ථිර සේවයේ පිහිටුවා, එම ප්‍රදේශවල පවතින වන අලි ගැටලුව විසඳීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3221/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂයේදී ශ්‍රී ලාංකික ජනගහනයේ ප්‍රතිශතය එක් එක් ආගම අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් තොරතුරු 2012 වර්ෂයේ පැවති ජාතික සංගණනයේ තොරතුරු හා තහවුරුවන්නේද;

(iii) බලහත්කාරයෙන් පුද්ගලයින් ආගම්වලට හරවාගැනීම් වාර්තාවීම් එක් එක් දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) බලහත්කාරයෙන් පුද්ගලයින් ආගම්වලට හරවාගැනීම් සිදුකළ පුද්ගලයින්ට එරෙහිව ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3590/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කර ඇති මෝටර් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එන්ජින් ධාරිතාව අනුව ආනයනය කළ එම මෝටර් රථ සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෝටර් රථ ආනයනය සඳහා වැය කරන ලද විදේශ විනිමය ප්‍රමාණය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ගෙවුම් ශේෂ ලේඛනයෙහි හිඟය හෝ අතිරික්තය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෝටර් රථ ගෙන්වීම සඳහා විදේශ විනිමය වැය කිරීමට සිදුවීම හේතු කොට ගෙන ගෙවුම් ශේෂයෙහි හිඟය වැඩිවීම කෙරෙහි දැඩි බලපෑමක් ඇතිකර තිබෙන බව පිළිගන්නේද;

(iii) එසේ නම්, ඒ අයුරින් ගෙවුම් ශේෂය කෙරෙහි ඇති වන පීඩනය අවම කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2014 මාර්තු මස 21 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3154/'12

ගරු රවි කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010, 2011, 2012 සහ 2013 වර්ෂවල,

(i) ශ්‍රී ලංකාවට පැමිණි මුළු සංචාරකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) සංචාරක ව්‍යාපාරයෙන් ලද ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2014, 2015, 2016 සහ 2017 යන වර්ෂවල ශ්‍රී ලංකාවට පැමිණෙතැයි අපේක්ෂා කරන සංචාරකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) 2009, 2010, 2011, 2012 හා 2013 වර්ෂවල තායිලන්තය, මැලේසියාව, මාලදිවයින, ඉන්දියාව, ඩුබායි, ඉන්දුනීසියාව හා වියට්නාමය යන රටවලට සංචාරය කළ සංචාරකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත සඳහන් රටවල් තුළ එක් දිනකදී සංචාරකයින් විසින් වැය කරනු ලබන මුදල් ප්‍රමාණයේ සාමාන්‍යය කොපමණද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3213/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර මහ නගර සභාව මගින් එක්රැස් කරන කැළිකසළ හා ඝන අපද්‍රව්‍ය හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටි ගොහාගොඩ නමැති ස්ථානයට බැහැර කරනු ලබන බවත්;

(ii) එම අපද්‍රව්‍ය මහවැලි ගඟට එකතුවීමෙන් ප්‍රදේශයේ පානීය ජලය අපවිත්‍රවීම හා දුර්ගන්ධය හේතුවෙන් ප්‍රදේශවාසීන් විවිධ රෝගී තත්ත්වයන්ට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මහනුවර මහ නගර සභාව මගින් කැළිකසළ විධිමත් ලෙස කළමණාකරණය කොට එය සම්පතක් බවට පත්කර ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3327/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා පොලිස් සේවයේ,

(i) ප්‍රධාන පොලිස් පරීක්ෂකවරුන්ගෙන් පහළ, අනෙකුත් ශ්‍රේණිවල උසස්වීම් ලබා දීමේ ක්‍රමවේදය කවරේද;

(ii) විශ්‍රාම යාමට අදාළව පවතින ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා පොලිසියේ පහළ ශ්‍රේණිවල නිලධාරීන් වෙත ලබා දෙන,

(i) මාසික පහන් දීමනා;

(ii) වාර්ෂික ප්‍රථමාධාර දීමනා;

(iii) මාසික දුෂ්කර දීමනා;

(iv) මාසික යහපත් හැසිරීම් දීමනා;

කොපමණද යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) පිට පළාත් පොලිස් ස්ථානවල පොලිස් නිලධාරීන්ගේ 'හට නිවාස' (බැරැක්ක) වල මූලික පහසුකම් සම්බන්ධයෙන් පවතින අඩුපාඩු පිළිබඳව එතුමා දන්නෙහිද?

(ඈ) කාන්තා පොලිස් නිලධාරිනියන් රාත්‍රී කාලයේ සේවයේ යෙදවීම සම්බන්ධයෙන් පැමිණිලි ලැබී තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

3432/'13

ගරු පී. හැරිසන් මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 දෙසැම්බර් මාසයේ ඇති වූ ජල ගැලීම් හේතුවෙන් අර්ධ හානියට හා පූර්ණ හානියට පත් නිවාස සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පූර්ණ හානියට පත් වූ නිවසකට සහ අර්ධ හානි සිදු වූ නිවසකට ගෙවනු ලබන වන්දි මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වන විට පූර්ණ හා අර්ධ හානි වූ නිවාස වෙනුවෙන් ගෙවා ඇති වන්දි මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම වන්දි මුදල් ලබා දී ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(v) එම වන්දි මුදල් ගෙවීම සිදුකරනු ලබන්නේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින්ද; නැතහොත් වෙනත් අමාත්‍යාංශයක් හෝ ආයතනයක් මගින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2012 වර්ෂයේ දී නායයෑම් හා ගංවතුර හේතුවෙන් ඇති වූ ආපදා තත්ත්වයන් නිසා අහිමි වූ ජීවිත සංඛ්‍යාව කොපමණද;

(ii) එම ජීවිත අහිමිවීම් සිදු වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iii) එලෙස ජීවිතය අහිමි වූ එක් අයෙකු වෙනුවෙන් ගෙවනු ලැබූ වන්දි මුදල කොපමණද;

(iv) එම වන්දි මුදල ගංවතුර හා නායයෑම් නිසා අතුරුදහන් වූ පුද්ගලයින් වෙනුවෙන් ද ලබා දෙන්නේද;

(v) ඉහත සඳහන් කාල සීමාව තුළ නායයෑම් සහ ගංවතුර හේතුවෙන් මියගිය අය වෙනුවෙන් මේ වන විට ගෙවා ඇති වන්දි මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3701/'13

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයට බදු ගෙවනු ලබන රාජ්‍ය හා පුද්ගලික ඉන්ධන අලෙවි සමාගම් කවරේද;

(ii) පසුගිය වර්ෂ 10 තුළ එම එක් එක් සමාගම වාර්ෂිකව ගෙවන ලද බදු ප්‍රමාණයන්, එක් එක් බදු වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බදු ගෙවීමේදී කවර හෝ සමාගමක් සඳහා කවර හෝ බදු නිදහසක් ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම සමාගම්වල නම් කවරේද;

(v) එවන් බදු සහනයක් ලබා දීමට හේතු කවරේද;

(vi) පසුගිය වර්ෂ දහය තුළ එම බදු සහනය ලබා දීම නිසා ශ්‍රී ලංකා රජය වෙත අහිමි වී ඇති බදු මුදල් ප්‍රමාණය එක් එක් බදු වර්ගය අනුව, වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4222/'13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ජාතික සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික සම්පත් අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය කොපමණද;

(ii) 2011, 2012 හා 2013 වර්ෂවලදී එම අමාත්‍යාංශයේ කටයුතු වෙනුවෙන් වැය කරන ලද මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ජාතික සම්පත් ආරක්ෂාව වෙනුවෙන් අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

(iv) ජාතික සම්පත් ප්‍රවර්ධනය වෙනුවෙන් අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4283/'13

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 අයවැය මගින් යෝජනා කළ රු. 750/= බැගින් වන රණවිරු දෙමාපිය මාසික දීමනාව ලබා දීමට සුදුස්සන් තෝරා ගැනීමේදී සලකා බලනු ලබන නිර්ණායක කවරේද;

(ii) මේ වන විට ඒ සඳහා හිමිකම් ලබා ඇති රණවිරු දෙමව්පියන් සංඛ්‍යාව කොපමණද;

(iii) දෙමව්පියන් හට එම දීමනාව සඳහා හිමිකම් ලැබීමට පදනම් වූ රණවිරුවන් සංඛ්‍යාව යුධ, නාවික සහ ගුවන් හමුදා අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොලිස් දෙපාර්තමේන්තුවේ දැනුම්දීමක් අනුව ඉහත දීමනාව ලැබීමට සුදුසුකම් ඇති පොලිස් නිලධාරීන්ගේ දෙමව්පියන් බැංකු ගිණුම් ආරම්භකර වර්ෂයකට වැඩි කාලයක් ගත වී ඇතත්, මේ දක්වා එකී දීමනාව එම ගිණුම්වලට බැර කර නොමැති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, පොලිස් නිලධාරීන්ගේ දෙමව්පියන් සඳහා ද එම දීමනාව ලබා දීමට පියවර ගනු ලබන්නේද;

(iii) ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4314/'13

ගරු තිස්ස අත්තනායක මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය ගණකාධිකාරි සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීමේ තරග විභාගය පවත්වා, 2013 මැයි මස 03 වැනි දින එහි ප්‍රතිඵල නිකුත් කළ බවත්;

(ii) එකී විභාගයේ ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ බවත්;

(iii) විභාගය සමත් නමුත් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් නොලැබූ පිරිසක් ඉතිරි වී ඇති බවත්;

(iv) ඔවුන්ගේ ප්‍රතිඵල සටහනෙහි ඔවුන් ලැබූ කුසලතාවය සටහන් කර දන්වා යවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය ගණකාධිකාරි සේවයේ III වැනි පන්තියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) උක්ත විභාගයේ ප්‍රතිඵල මත පවත්වනු ලැබූ සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගනු ලැබූ සංඛ්‍යාව කොපමණද;

(iii) තවදුරටත් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාවක් ඉතිරිව තිබේද;

(iv) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(v) එම පුරප්පාඩු පිරවීම සඳහා ඉහත විභාගයෙන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද පුද්ගලයින් බඳවා ගත හැකි බව පිළිගන්නේද;

(vi) එසේ නම්, ඒ සඳහා ගත හැකි ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4329/'13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය ශල්‍ය අත්වැසුම් (Surgical Gloves) අවසාන වරට මිලදී ගත් දිනය කවරේද;

(ii) එදින මිලදී ගත් අත්වැසුම් ප්‍රමාණය කොපමණද;

(iii) එම මිලදී ගැනීම සඳහා විවෘත ටෙන්ඩර් කැඳවීමක් සිදුකරනු ලැබුවේද;

(iv) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ සමාගම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දැනට රෝහල්වල භාවිතා කරන ශල්‍ය අත්වැසුම් සපයනු ලබන ආයතනය විළවුන් උපකරණ හා ඖෂධ නියාමන අධිකාරිය යටතේ ලියාපදිංචි කර තිබේද;

(ii) රෝහල්වලට ශල්‍ය අත්වැසුම් සැපයීම සඳහා රජය වසරකට වැය කරන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3155/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ කොටස් හුවමාරුව පිහිටුවන ලද්දේ කවදාද;

(ii) එහි දැනට ක්‍රියාත්මකව පවතින ශාඛා සංඛ්‍යාව කොපමණද;

(iii) පසුගිය වර්ෂ 3 තුළ, එහි ක්‍රියාත්මකව සිටි තැනැත්තන්, ආයතන හා තැරැව්කරුවන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එමෙන්ම, ප්‍රතිශත ප්‍රභේද අනුව, එනම් 1% - 2% දක්වා, 3% - 5% දක්වා, 6% - 15% දක්වා, 16% - 40% දක්වා සහ 41% - 100% දක්වා පදනමින් වෙළෙඳුන් හා ආයෝජකයින් වැනි විවිධ ආයතන විසින් කොටස් වෙළෙඳපළ ප්‍රාග්ධනීකරණය කර ඇති ආකාරයද, ඒ එකිනෙක කාණ්ඩයට අඩංගුවන කොටස් සංඛ්‍යාව කොපමණද යන්නද එතුමා සඳහන් කරන්නෙනෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3214/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2007 වර්ෂයේදී පොලිස් සැරයන් තනතුරේ සිට උප පොලිස් පරීක්ෂක තනතුරට සේවා කාලය හා කුසලතාව මත උසස්වීම් ලබා දුන් බවත්;

(ii) එම උසස්වීම් ලබා දීමේදී කඩඉම් ලකුණු සීමාව 62 වුව ද, ලකුණු 47ට අඩු නිලධාරීන් හතර දෙනෙකුටද උසස්වීම් ලබා දී ඇති බවත්;

(iii) ලකුණු 47 ට වැඩියෙන් ලබා සිටි නිලධාරීන් අභියාචනා ඉදිරිපත් කළ ද ඒවා නොසලකා හැර ඇති බවත්;

(iv) එම උසස්වීම් ලබාදීමේදී මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ නිලධාරීන් පිරිසක් ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ පිහිට පැතූ බවත්;

(v) එම පිරිසට පමණක් උසස්වීම් ලබා දී ඇති බවත්;

(vi) විනයගරුක නිලධාරීන් ලෙස අධිකරණයේ පිහිට නොපැතූ පිරිසට මෙතෙක් උසස්වීම් ලබා නොදීම දැඩි අසාධාරණයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එලෙස අසාධාරණයට ලක් වූ නිලධාරීන්ට අදාළ උසස්වීම් ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3702/'13

ගරු අනුර දිසානායක මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යෝජිත කොළඹ - නුවර අධිවේගී මාර්ගයේ දුර ප්‍රමාණය කොපමණද;

(ii) එය ඉදිකිරීම සම්බන්ධයෙන් දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම අධිවේගී මාර්ගය සකස් කිරීම වෙනුවෙන් දරන සමස්ත පිරිවැය කොපමණද;

(iv) එම පිරිවැය සපයා ගැනීමට ණය ලබා ගන්නේ නම්, එම ණය ලබා ගන්නා ආයතනය කවරේද;

(v) එම ණය වෙනුවෙන් ගෙවිය යුතු පොලී අනුපාතය සහ ඊට අදාළ අනෙකුත් කොන්දේසි කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කොළඹ - නුවර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු පවරා ඇති සමාගම කවරේද;

(ii) එම සමාගම තෝරා ගැනීමේදී විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3822/'13

ගරු පී. හැරිසන් මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තඹුත්තේගම නගරය මහවැලි නගර සැලැස්මේ ඇති සැලසුම් සහගත නගරයක් බව පිළිගන්නේද;

(ii) එම නගරයේ මුල් සැලැස්ම අනුව සිටින ඉඩම්ලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම මුල් ඉඩම්ලාභීන්ගෙන් මේ වන විට පදිංචිව සිටින සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) තඹුත්තේගම නගරයේ සිටින අනවසර පදිංචිකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පදිංචිකරුවන් අදාළ ඉඩම්වල අනවසරයෙන් පදිංචි වී ඇති වර්ෂයන් කවරේද;

(iii) අනවසර පදිංචිකරුවන්ට ගොඩනැගිලි ඉදිකිරීමට, විදුලිය හා ජලය ලබා ගැනීමට මහවැලි අධිකාරිය අවසර දී තිබේද;

(iv) 2013 වර්ෂයේ මුල් භාගයේ ද අනවසර පදිංචිකරුවන් විසින් ඉදිකිරීම් කළ බව පිළිගන්නේද;

(v) අනවසර පදිංචිකරුවන්ට ඉදිකිරීම් සිදුකිරීමට ඉඩ ලබා දී නිහඬ පිළිවෙතක සිටින නිලධාරීන්ට එරෙහිව ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අනවසර පදිංචිකරුවන්ගේ ඉඩම් නීත්‍යානුකූල කිරීමට පියවර ගන්නේද;

(ii) නොඑසේ නම්, නගර සැලැස්ම අනුව ඔවුන් ඉවත් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3218/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, ගලගෙදර තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් ඉවත් කරන ලද කැළිකසළ හා ඝන අපද්‍රව්‍ය පූජාපිටිය ප්‍රාදේශීය සභාවට අයත්, දික්ඔයවත්ත නමැති ඉඩමට බැහැර කරන බවත්;

(ii) බැහැර කරන අපද්‍රව්‍ය එම ප්‍රදේශයේ ජලයට එකතුවීම නිසා අවට ජනතාව රෝගී තත්ත්වයන්ට මුහුණපා ඇති බවත්;

(iii) අපද්‍රව්‍ය මෙම ස්ථානයට ගෙන ගොස් දැමීම නතර කරන ලෙස අදාළ බලධාරීන් දැනුවත් කළද මේ දක්වා විසඳුමක් නොලැබුණු බවට ප්‍රදේශවාසීන් චෝදනා කරන බවත්;

(iv) කැළිකසළ ප්‍රවාහනය කිරීම හේතුවෙන් අවට මාර්ග කිහිපයක්ද මේ වන විට විනාශ වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කසළ ප්‍රවාහනය නිසා විනාශ වූ මාර්ග සංවර්ධනය කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඉවතලන කැළිකසළ ඉහත සඳහන් ස්ථානයට බැහැර කිරීම නතර කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3222/'12

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006, 2007, 2008, 2009, 2010, 2011 සහ 2012 යන වර්ෂ සඳහා රාජ්‍ය සේවය තුළ උත්පාදනය කළ රැකියා සංඛ්‍යාව දිස්ත්‍රික් පදනමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කී රැකියා උත්පාදනය කරන ලද අංශයන් කවරේද;

(iii) ඉහත කී රැකියා ලබා දීම සිදු කොට ඇත්තේ අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන්ද;

(iv) පුද්ගලයින් තෝරා ගැනීම කුසලතා පදනම මත සිදු කරන ලද්දේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?